# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1760/45 – 2012 ජුනි 01 වැනි සිකුරාදා – 2012.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉංගිරිය වත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ක.4357 දරන මූලික පිඹුරේ කැබලි අංක 02න් දැක්වෙන ඉඩම් කොටස.

**කැබලි අංක 02**
ඉඩමේ නම: ඉංගිරිය වත්ත; විස්තරය: ගෙවත්ත, අබලන් වූ ගොඩනැගිලි දෙකක්, අවු 50 - 60ක් වයසැති පොල් වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.4826.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජූලි මස 25 වැනි දින පූ. භා. 10.00ට ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජූලි මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්ලිව්. පී. සී. එම්. උපසේන,
ප්‍රාදේශීය ලේකම්,
ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2012 මැයි මස 15 වැනි දින,
ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

06 - 617

1A – G 16142 – 450 (2012/06)

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: DS/KU/LA/NAVY/GOP.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 03/J/80/S/58.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩමේ හිමිකම ආණ්ඩුව අත්පත් කරගෙන ඇති බව, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අත්පත් කරගෙන ඇති ඉඩමේ විස්තර:

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝබාලපුරම් ග්‍රාම නිලධාරි වසමේ ඉරක්කණ්ඩි කාඩු හෝ සින්නතෝට්ටම් නමැති මැණුම්පති විසින් 2003.04.30 දින සකස් කර ටෝපො පි. පි. 37 දරන පිඹුරේ කැබලි අංක 2047 වශයෙන් මැන ඇති ප්‍රමාණය හෙක්ටයාර් 14.1283 හා පහත දැක්වෙන මායිම් සහිත ඉඩම.

උතුරට: කැබලි අංක 1877, 1874, 664 1/4.
නැගෙනහිරට: කැබලි අංක 664 1/4, 813, 790, 789, 788, 787, 786, 785.
දකුණට: කැබලි අංක 790, 789, 788, 787, 786, 789.
බටහිරට: කැබලි අංක 1877, 1871.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 නොවැම්බර් මස 26 වැනි දින පූ. භා. 10.00ට කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 නොවැම්බර් මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඒ. උමාමහේස්වරන්,
ප්‍රාදේශීය ලේකම්,
කුච්චවෙලි

2012 මැයි මස 04 වැනි දින,
කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

06 - 618

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: හලි/ප්‍රාලේ/3/2/2/36 (1).
ඉඩම් අමාත්‍යංශයේ අංකය: LD/05/2008/L/249.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව (ගල්දොළ ජනපදයට ඇතුළුවන මාර්ගය) ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:

මහනුවර දිස්ත්‍රික්කයේ, හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩපළාත බටහිර කෝරළේ අංක 314 - ගල්දොළ ග්‍රාම නිලධාරී වසමේ මීදෙණිය ගමේ පිහිටි ගල්දොළ එස්ටේට් නමැති ඉඩම ප්‍රමාණයෙන් හෙක්. 0.0244ක් සහ හලංගොඩවත්ත නමැති ඉඩම ප්‍රමාණයෙන් හෙක්. 0.0091ක් ද වූ බිම් කොටස් සඳහා මහ/එච්ටීආර්/2011/397 යටතේ 2012.03.26 දින මැණුම්පති විසින් පිළියෙල කර ඇති අ. ග. පි. 201 අතිරේක 05 පත්‍ර අංක 05හි කැබලි අංක 331 හා 332 වශයෙන් මැන වෙන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0355ක් වූ බිම් කොටස්.

**මායිම් උපලේඛනය**

ඉඩමේ නම: කැබලි අංක 331, ගල්දොළ එස්ටේට්.
උතුරට: කැබලි අංක 305 සහ 306.
නැගෙනහිරට: කැබලි අංක 306 සහ 305.
දකුණට: කැබලි අංක 305, 321 සහ 332.
බටහිරට: කැබලි අංක 332, 206 සහ 305.
හිමිකම් කියන අය: රත්නායක මුදියන්සේලාගේ කුඩාබන්ඩා, 'රත්න' ගල්දොළ උඩුව - මහනුවර

ඉඩමේ නම: කැබලි අංක 332, හලංගොඩ වත්ත.
උතුරට: කැබලි අංක 206, 305 සහ 331.
නැගෙනහිරට: කැබලි අංක 331, 305 සහ 321.
දකුණට: කැබලි අංක 321.
බටහිරට: කැබලි අංක 321 සහ 206.
අයිතිවාසිකම් කියන අය උඩහපොල්වත්තේ ගෙදර සෙනෙවිරත්න බණ්ඩා, අඹෝරුව, අටදෙණිය, මහනුවර.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජූලි මස 11 වැනි දින පූ. භා. 10.00ට හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජුනි මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ. පී. සිරිබද්දන,
ප්‍රාදේශීය ලේකම්,
හතරලියද්දද.

2012 මැයි මස 18 වන දින,
හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

06 - 619

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: ජීසීඑෆ්/අත්/කේඩී/22ඒ/එල්ආර්.

මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ පාර්ලිමේන්තු වැව ඉස්මත්තේ ජල රැඳවුම් ප්‍රදේශය සඳහා පහත විස්තර කර ඇති ඉඩම රජයට පවරාගෙන ඇති බැවි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පවරාගන්නා ලද ඉඩමේ විස්තර:

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහ නගර සභා සීමාවේ, බත්තරමුල්ල හා තලංගම යන ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 8548 හා 2002.07.15 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01, 05, 06, 07, 08, 09, 10, 11, 12, 15, 16, 17, 18, 19, 20, 21, 22 සහ 23 වශයෙන් දැක්වෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 6.1818ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි දහ අට (18):

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: වැටකෙයියා පොත කුඹුර; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය, සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය, සෙත්සිරිපාය, බත්තරමුල්ල; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 1.4316.

02. **කැබලි අංක 05**
ඉඩමේ නම: පෙලන්ගහ කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආර්. ඒ. රත්නා පද්මිණි, අංක 133/2, පන්සල පාර, මහරගම; ප්‍රමාණය: හෙක්. 0.3641.

03. **කැබලි අංක 06**
ඉඩමේ නම: පෙලන්ගහ කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. එස්. පීරිස් මහත්මිය, අංක 39/4, ඩී. එස්. සේනානායක මාවත, බොරැල්ල; ප්‍රමාණය: හෙක්. 0.2590.

04. **කැබලි අංක 07**
ඉඩමේ නම: පෙලන්ගහ කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ධර්මදාස, ලිපිනය නොදනී; ප්‍රමාණය: හෙක්. 0.2724.

05. **කැබලි අංක 08**
ඉඩමේ නම: පෙලන්ගහ කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. චාර්ලිස් පෙරේරා, අංක 70, රොබට් ගුණවර්ධන මාවත, තලංගම දකුණ; ප්‍රමාණය: හෙක්. 0.1856.

06. **කැබලි අංක 09**
ඉඩමේ නම: වෙලේ කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. ඊ. එෆ්. ද කොස්තා, අංක 78, කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්. 0.5376.

07. **කැබලි අංක 10**
ඉඩමේ නම: වෙලේ කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. ආර්. සූරියසේන, රොබට් ගුණවර්ධන මාවත, තලංගම දකුණ, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්. 0.5381.

08. **කැබලි අංක 11**
ඉඩමේ නම: දිය කඩිත්ත යාය; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. ආර්. සූරියසේන, රොබට් ගුණවර්ධන් මාවත, තලංගම දකුණ, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්. 0.2826.

09. **කැබලි අංක 12**
ඉඩමේ නම: දිය කඩිත්ත යාය; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.3996.

10. **කැබලි අංක 15**
ඉඩමේ නම: පෙලන්ගහ කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. ඩී. සෝමදාස, අංක 117, රොබට් ගුණවර්ධන මාවත, කොරාඹේ, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්. 0.4452.

11. **කැබලි අංක 16**
ඉඩමේ නම: පෙලන්ගහ කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. ආර්. හේමසිරි, ලිපිනය නොදනී; ප්‍රමාණය: හෙක්. 0.3272.

12. **කැබලි අංක 17**
ඉඩමේ නම: වැටකෙයියාපොත යාය; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එල්. අයි. පී. පලිහවඩන, සිසිර පෙරේරා ගාඩ්න්ස්, පැලවත්ත, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්. 0.0029.

13. **කැබලි අංක 18**
ඉඩමේ නම: වැටකෙයියාපොත යාය; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.2506.

14. **කැබලි අංක 19**
ඉඩමේ නම: වැටකෙයියාපොත යාය; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය:නොදනී; ප්‍රමාණය: හෙක්. 0.2781.

15. **කැබලි අංක 20**
ඉඩමේ නම: වැටකෙයියාපොත යාය; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය:නොදනී; ප්‍රමාණය: හෙක්. 0.0198.

16. **කැබලි අංක 21**
ඉඩමේ නම: වැටකෙයියාපොත යාය; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. ඒ. ජී. වික්‍රමසිංහ, අංක 07, කීල්ස් නිවාස, ඉහළ බෝමිරිය, කඩුවෙල; ප්‍රමාණය: හෙක්. 0.3765.

17. **කැබලි අංක 22**
ඉඩමේ නම: වැටකෙයියාපොත යාය; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. කේ. ආර්. සමරසේකර, අංක 1/394, ලිලී මාවත, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්. 0.2044.

18. **කැබලි අංක 23**
ඉඩමේ නම: වැටකෙයියාපොත යාය; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. කේ. ආර්. සමරසේකර, අංක. 1/394, ලිලී මාවත, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්. 0.0065.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජූලි මස 05 වැනි දින පූ. හා. 10.00ට රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජූනි මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

සී. ඩබ්ලිව්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2012 මාර්තු මස 14 වැනි දින,
මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති කාර්යාලය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

06 - 620

---

සංශෝධනය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: මතු/ඉඅ/4/32.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගොඩවත්ත පහල කෙටස මූ. පි. ක 3841 දරන මූලික පිඹුරට අයත් ඉඩම සම්බන්ධයෙන් අංක 1735/8 හා 2011.12.05 දිනැති රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 07 වගන්තිය යටතේ දැන්වීමේ හිමිකම් පරීක්ෂණ පැවැත්වීමේ දිනය 2012.08.09 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මේ අනුව හිමිකම් පෑමේ හා වන්දි ඉල්ලුම් කිරීමේ ලියවිලි එවිය යුතු අවසාන දිනය 2012.08.02 දින ලෙසද දීර්ඝ කරනු ලැබේ.

සුජානි මහේෂා සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
මතුගම.

2012 මැයි මස 23 වැනි දින,
මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

06 - 616

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.